# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2107/10 - 2019 ජනවාරි මස 22 වැනි අඟහරුවාදා - 2019.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය.*: GM/DS/2016/2/2/1/138.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය.*: 4-3/8/2016/HA/405.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කටුවාලමුල්ල ගමේ, අංක 244 ඩී, කටුවාලමුල්ල උතුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2018.11.02 දිනැතිව පිළියෙල කරන ලද මු.පි.ගම්. අංක 4108, කැබලි අංක 1 හි බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0101 ක් වූ පහත සඳහන් ඉඩම් කොටස:

01. **කැබලි අංක 1**

ඉඩමේ නම: ගොන්නගහවත්ත සහ අඹගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: යාත්‍රාමුල්ලගේ ධර්මසිරි, අංක 52, කටුවාලමුල්ල, ගණේමුල්ල; ප්‍රමාණය; හෙක්ටයාර් 0.0101.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019 මැයි මස 08 වැනි දින, පෙ.ව. 10.00 ට, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2019 අප්‍රේල් මස 29 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

කේ.ඒ.එස්. ලක්ශ්‍රීණි ගුණතිලක,
ප්‍රාදේශීය ලේකම් හා අත්කර ගැනීමේ නිලධාරි,
ගම්පහ.

2019 ජනවාරි මස 18 වැනි දින,
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

02-230

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 29288 – 17 (2019/01)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.